# අටමස්ථානයෙහි ඉතිහාසය

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක
මරදන්කල්ලේ සුසීම හිමි

මිහිඳු මහරහතන්වහන්සේ ලක්දිවට වැඩම කිරීමෙන් පසු උන්වහන්සේගේ සම්මානයට ලක්වූ ස්ථාන අට අටමස්ථානය ලෙස හඳුන්වනු ලැබේ. "අෂ්ට මහා ස්ථාන" යන සංස්කෘත වචනයෙන් අටමස්ථාන යන්න සෑදුන බව විචාරකයෝ පවසති.

බෞද්ධ ජනයා අනුරාධපුරයට පැමිණෙන්නේ විශේෂයෙන් මේ අටමස්ථානය දැක වැඳ පුදා ගැනීමටය. එහෙත් නිවැරදිව අටමස්ථානය කුමක් ද යන්න සොයාගැනීම මෙහිදී අපහට පැන නගින එක් ප්‍රශ්නයකි. එය සොයා ගැනීමට ලක්දිව බොහෝ වියතුන් ප්‍රයත්න දරා ඇතිබව ඒ පිළිබඳ ලියවුනු නොයෙක් ග්‍රන්ථවලින් හා විවේචනයන්ගෙන් පැහැදිලිවේ. මෙහිදී මා බලාපොරොත්තු වන්නේ එක් එක් වියතුන් අටමස්ථානය ගැන දක්වා ඇති අදහස් හා අවසානයෙහි සම්මතව ඇති අටමස්ථානය පිළිබඳ ඉතිහාසය බිඳක් හෙළිකිරීමටය.

පැරණි බෞද්ධ කෘතිවල පළමුවරට අටමස්ථානයක් ගැන සඳහන් වන්නේ පූජාවලියේය. එහි සඳහන් ස්ථාන අට නම්—

(1) දකුණු මහ සෑය පිහිටි තැන
(2) ශ්‍රී මහා බෝධිය පිහිටි තැන
(3) ලෝවාමහාපාය පිහිටි තැන
(4) පිරිත්ලාගෙය පිහිටි තැන
(5) දන්ථාදරනම් පොකුණ පිහිටි තැන
(6) ථූපාරාමය පිහිටි තැන
(7) රුවන්වැලිසෑය පිහිටි තැන
(8) මිහින්තලයේ මහසලසෑය පිහිටි තැන

යන ස්ථාන අටයි. මේ හැරුණුවිට ගෞතම බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩි අවස්ථාවල සමවත් සුවයෙන් වැඩ සිටි ස්ථාන අටක් ගැන 15 වැනි ශත වර්ෂයෙහි ධම්මදින්නාචාර්‍ය විමලකීර්ති මහා ස්වාමීන් වහන්සේ විසින් රචිත සද්ධර්ම රත්නාකරයෙහි 13 වෙනි පරිච්ඡේදයෙහි සඳහන්වේ. එහි ඉහත සඳහන් ස්ථාන 8න් 7 ක්ම ඇති අතර දකුණු මහ සෑය වෙනුවට රුවන්පාය පිහිටන්නාවූ පතන්භූමි ස්ථානය යෙදීම මෙහි දක්නට ලැබෙන විශේෂ වෙනසයි. එහෙත් මේ ස්ථාන අට අටමස්ථානය යයි හඳුන්වා නොමැත. පසුකාලයක ඇතිවූ නොයෙක් විනාශකාරී බලවේග නිසා නියම අටමස්ථානය ගරාවැටී විනාශ වී යන්නට ඇති අතර ඒවායින් සමහරක් සොයාගෙන එසේ සොයාගැනීමට නොහැකි වූ ඒවාට වෙනත් ස්ථාන ඇතුලත් කොට වෙනම නාමාවලියක් සකස් කරන්නට ඇතැයි සිතිය හැකිය. ඒ කෙසේවුවත් මහනුවර යුගයට අයත් නම් පොතෙහිද ස්ථාන 8ක් ගැන දක්වා තිබේ. එය මෙසේය:—

(1) ශ්‍රීමාබෝධිය
(2) ලෝවාමහපාය
(3) මිරිසවැටිය
(4) අභයගිරිය
(5) ජේතවනය
(6) රුවන්වැලි සෑය
(7) ථූපාරාමය
(8) මිහින්තලය යනුවෙනි.

කෙසේවුවත් අවසන්වරට ක්‍රි.ව. එක්දහස් අටසිය හැත්තෑ ගණන්වලදී සර්වෙයර් ජනරාල් තුමා සකස් කළ සැලැස්ම අනුව අටමස්ථානයට අයත් භූමි ප්‍රමාණයද අනුව පැහැදිලි වශයෙන් ස්ථාන අටක් සකස්කර ඇත. එය මෙසේය—

| | |
|---|---|
| (1) ජේතවනය | (5) ලෝවාමහපාය |
| (2) ලංකාරාමය | (6) ජයශ්‍රී මහා බෝධිය |
| (3) ථූපාරාමය | (7) මිරිසවැටිය |
| (4) අභයගිරිය | (8) රුවන්වැලි චෛත්‍යය (හා මළුව) |

මෙම බෙදීමෙන් ද පසු අටමස්ථාන කොමිටියෙහි සාමාජිකයන් හා එවකට ලංකාණ්ඩුකාරයාව සිටි සර් එච්. ඒ. මැකලම් මහතා අතර ඇතිවූ සාකච්ඡාවකින් පසු එම කොමිටියේ ලේකම්වරයා විසින් පහත සඳහන් ස්ථාන අට අටමස්ථානය ලෙස සැලකීමට තීරණය කරගෙන තිබේ.

| | |
|---|---|
| (1) බෝමළුව | (5) ථූපාරාමය |
| (2) ලෝවාමහපාය | (6) ජේතවනය |
| (3) රුවන්වැලි සෑය | (7) ලංකාරාමය |
| (4) අභයගිරි වෙහෙර | (8) මිරිසවැටිය. |

මෙසේ දැන් ව්‍යවහාරයේ ඇති අටමස්ථානය සාකච්ඡා මාර්ගයෙන් සම්මත කරගෙන හඳුන් වන්නක් මිස මිහිඳු මහරහතන් වහන්සේගේ සම්මානයට හේතු වූ ස්ථාන අට සොයාගෙන හඳුන් වන්නක් නොවේ. කෙසේ වෙතත් මේ ස්ථාන අටෙන් කීපයක් හෝ නිවැරදි අටමස්ථානයට අයත් විය හැකිය. මේ ලිපියේදී මා බලාපොරොත්තු වන්නේ අවසානයට තීරණයවූ මේ අටමස්ථානය ගැන ඉතිහාසය බිඳක් දැක්වීමට විනා නිවැරදි අටමස්ථානයක් ඉදිරිපත් කිරීමට නොවන බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි. එහිදී අපි පළමුවෙන්ම බෝමළුව හෙවත් ශ්‍රී මහා බෝධිය ගෙන බලමු.

## 1. බෝමළුව

මෙහිදී බෝමළුව ලෙස කියා ඇත්තේ ශ්‍රී මහා බෝධිය හා මළුවයි. ශ්‍රී බු .ව. 236 (ක්‍රි. පූ. 307) දී සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ විසින් දඹදිව සිට ශ්‍රී මහාබෝධි දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කරවන ලදි. දැනට වර්ෂ 2290 තරම් වයස ඇති (ලක්දිවට වැඩමවා) මෙම බෝධීන් වහන්සේ සකල ලෝකවාසී බෞද්ධ ජනතාවගේ අතිශය ගෞරවාදරයට පාත්‍රව අද දක්වාම නිරුපද්‍රැතව වැඩ වෙසෙති.

දෙවන පැතිස් රජු මෙම බෝධීන්වහන්සේ රෝපණය කිරීම සඳහා මළුව අතිවිශෙෂ අන්දමින් සකස් කොට තිබේ. පොළොව මට්ටමින් අඩි 21 ක් ගොඩකර උඳුවප් මස පුරපසළොස්වක් පුණු පොහෝදට පෙරදින සවස මෙම බෝධීන්වහන්සේ පිහිටුවන ලදී. දැනට පරිවාර බෝධීන් රැසක ගෙන් සමන්විත මෙම බෝධීන් වහන්සේ පහසුවෙන් දැක ගැනීමට නම් උතුරු දෙරටුවෙන් යායුතුය. නැගෙනහිර දෙරටුවෙහි විහාර මන්දිරය පිහිටුවා තිබෙන නිසා හරිහැටි දිස්නොවේ. රන්වැටකින් අලංකාර කර ඇති මෙම බෝධීන් වහන්සේ ලක්දිව බෞද්ධ ජනයාගේ මුදුන්මල්කඩකි.

## 2. ලෝවාමහාපාය

තඹ ලෝ උළු සෙවිලි කළ හෙයින් "ලෝවා මහාපාය" නමින් ව්‍යවහාරයට පත් මෙම හා ප්‍රාසාදය මහමෙවුනා උයනෙහි පිහිටුවන ලබන "මහාසංඝයාගේ පොහොය ගෙය මෙහි වන්නේය" යයි එද මිහිඳු මහරහතන් වහන්සේ පෙන්වා අවුරුදු 147 කට පසු හෙවත් බු.ව. 383 දී

දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද්දකි. මහල් නවයකින් යුක්තව තිබුණ බව කියන මේ ලෝහ මහා ප්‍රාසාදය බු.ව. 406 දී පමණ පහනකින් ඇවිලගත් ගින්නකින් විනාශ වී ගිය බව මේ පිළිබඳ ලියවුණු නොයෙක් ග්‍රන්ථවල සඳහන් වන්නකි. ඉන්පසු සද්ධාතිස්ස රජතුමා නැවත සත් මහල් කොට ගොඩනැංවූ මෙම ප්‍රාසාදය බු.ව. 739 වන විට දිරාපත් විය. එයද සිරිනාග රජතුමා නැවත පස් මහල් කොට කරවිය. බු.ව. 819 දී වෛතුල්‍ය වාදය පිළිගත් මහසෙන් රජු මෙම වටිනා ප්‍රාසාදය බිඳ හෙළුමුත් සිරිමෙවන් රජතුමා විසින් බු.ව. 845 දී නැවත පස්මහල් කොට කරවන ලදී. මෙසේ අලංකාර මන්දිරයක්ව පැවති මෙම ලෝවාමහාප්‍රාසාදයෙහි දැනට ඉතිරිව ඇත්තේ ගල්කණු රැසක් පමණි.

3. රුවන්වැලි සෑය

ස්වර්ණමාලී නම් දිව්‍යාංගනාව විසූ රන් තෙලඹුගස තිබූ තැන චෛත්‍යය කරවූ නිසා "ස්වර්ණමාලී" යන නාමය ඇතිවූ බව ජනප්‍රවාදයයි. එසේම ද්‍රෝණයක් පමණ සර්වඥධාතු නිදන් කොට ඇති බැවින් එයට පූජෝපහාර වශයෙන් රන්මල් ධාතුගර්භය පුරා අතුරා ඇති නිසා මෙම ස්වර්ණමාලී යන නාමය ව්‍යවහාර වන බව ඇතමුන්ගේ මතයයි. කෙසේ වුවත් මෙම ස්ථාන යෙහි සතර බුදුවරයන් වහන්සේලාම වැඩහුන් බැවින් මෙම ස්ථානය සර්වඥපාරිභෝගික භූමියකි.

බු.ව. 383 (ක්‍රි.පූ. 161) වැන්නෙහිදී පමණ රජකළ දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද මෙම චෛත්‍යයෙහි වටප්‍රමාණය අඩි 1000 ට ආසන්නය. උස අඩි 338 ක් පමණ වේ. දැනට මෙය ගොඩ නගා අවුරුදු 2144 පමණ වන අතර අද ලක්දිව ඇති දර්ශනීය චෛත්‍ය රාජයා බවට පත්වී තිබේ. එහෙත් අද දක්නට ලැබෙන චෛත්‍යය මුලින්ම ගොඩනැගූ චෛත්‍යය නොව ප්‍රතිසංස්කරණය කරන ලද්දකි. ක්‍රි.ව. එක්දහස් අටසිය ගණන් වනතෙක්ම මෙය ගරාවැටුණු තත්වයෙන් පැවතිණි. පසුව 1873 දී නාරන්විට සුමනසාර ස්ථවිරයන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් ඇරඹී ප්‍රතිසංස්කරණ කටයුතු පසුව රුවන්වැලි චෛත්‍ය වර්ධන සමාගම මගින් කරගෙන යන ලදී. 1938 දී එම චෛත්‍ය කටයුතු නිමකරන ලදුව 1942 දී කොත්පැළඳවීම ද සිදුකර ඇත.

4. අභයගිරිවෙහෙර

වළගම්බා රජු විසින් කරවන ලද මෙම චෛත්‍යයට "අභයගිරි" යන නම ව්‍යවහාර වන්නේ ගිරිනම් නිගණ්ඨයා විසූ තැන කරවන ලද නිසාය. බුදුරදුන් ලක්දිවට වැඩමකළ තෙවෙනි වතාවේදී මේ ස්ථානයේදී මොහොතක් සමවත් සුවයෙන් වැඩහිඳ ඇති නිසා මෙම ස්ථානයද සර්වඥ පාරිභෝගික ශුද්ධ භූමියකි.

රනින් කළ ගව රූපයක් තුළ සර්වඥධාතු බහා එය මෙම චෛත්‍යයෙහි නිදන්කර ඇත්බව සැලකේ. ඉහත සඳහන් ගිරිනිගණ්ඨයා වළගම්බාරජු ද්‍රවිඩයන් සමහ යුද්ධකොට පැරදී පලායද්දී "මහකළු සිංහලයා පැරදී පලායතැයි" හඬනහා කීයේද මේ ස්ථානයේ දී බව පොත පතේ සඳහන් වේ. මහා තිස්ස ස්ථවිරයන් වහන්සේ රජුට ආරක්ෂාව සලසා දුන්හ. වළගම්බා රජු නැවත රජපැමිණි පසු එම නිගණ්ඨයා විසූ ආශ්‍රමය අභයගිරි විහාරය බවට පරිවර්තනය කරන ලදී. බු.ව. 455 (ක්‍රි.පූ.89) වැන්නෙහි රජ පැමිණි වළගම්බා රජු විසින් කරවන ලද මෙම චෛත්‍යයෙහි උස අඩි 245 කි. මෙය සාද දැනට වසර 2072 පමණ ගතවී තිබේ. මුලදී ලක්වැසියන් මෙය ජේතවනය වශයෙන් ව්‍යවහාර කළ ද පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අභයගිරිය යයි නම්කොට තිබේ. දැනට මෙය ගරා වැටුණු ස්වභාවයෙන් පවතී.

5. ථූපාරාමය

ථූපය පෙරටුකොට කරවන ලද ආරාමය නිසා "ථූපාරාමය" යනුවෙන් හඳුන්වනු ලැබේ. ආරාමය නැතිව ගිය කල්හිවුවද චෛත්‍යරාජයන්වහන්සේ පමණක් ථූපාරාමය ලෙස හැඳින්වේ. රුවන්වැලි සෑ මළුවෙන් උතුරු දෙස බලනවිට මෙම චෛත්‍යරාජයා දැකගත හැකිය. මෙම ස්ථානයෙහි පිළිවෙළින් කකුසඳ, කෝනාගමන, කාශ්‍යප යන බුදුවරුන්ගේ ධඹරාධාතුව, පටිධාතුව, ජලසාටිකාව යන වස්තූන් නිදන්කොට ඒ ඒ කාලවල චෛත්‍ය කරවන ලද්දේය. අප ගෞතම

බුදුරදුන්ගේ දකුණු අකු ධාතුව නිදන්කොට දෙවන පැතිස් රජු විසින් මේ චෛත්‍යය කරවන ලදී. අප ගෞතම බුදුරදුන් මේ ස්ථානයේද මොහොතක් සමවත් සුවයෙන් වැඩසිටි නිසා මෙම ස්ථානයද සර්වඥපාරිභෝගික ශුද්ධ භූමියකි.

මෙය ශ්‍රී ලංකාද්වීපයේ බුදු සසුන පිහිටුවීමෙන් පසු කරවන ලද පළමු චෛත්‍යරාජයාය. දෙවන පැතිස් රජු විසින් මෙයටම යාබදව සංඝාරාමයක් ද කරවන ලදී. චෛත්‍යයේ වටප්‍රමාණය අඩි 194කි. උස අඩි 63ක් පමණ වේ. බු.ව. 236 (ක්‍රි.පූ. 307) වැන්නෙහි මෙම චෛත්‍යය ගොඩනහා ඇත. මේ අනුව බලනවිට දැනට වසර 2,290ක් තරම් කාලයකට පෙර මෙම චෛත්‍යය නිමවා ඇති බව පෙනේ. මෙම චෛත්‍යයට ආරක්ෂාව හා අලංකාරය පිණිස වටදාගෙයක් ඉදිකර තිබුණු බවට අදත් සාධක තිබේ. අග්බෝ, ශිලාමේඝ ආදී රජවරු මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු කර ඇත. අෂ්ට ඵලරුහ බෝධීන්ගෙන් එකක් ද මෙම චෛත්‍ය ස්ථානයෙහි පිහිටවූ බව වාර්තාගතය.

### 6. ජේතවනය

මෙම චෛත්‍යරාජයාට මෙම නම ව්‍යවහාර වූයේ ජෝතිවන නම් උද්‍යානයෙහි කරවූ නිසාය. ජෝතිවන චෛත්‍ය නමින් වූ මෙය පසුව ජේතවනය නමින් හැඳින්විණි. බුදුරදුන් තුන්වැනි වරට ලක්දිවට වැඩමකළ අවස්ථාවේ මෙම ස්ථානයෙහිද මොහොතක් කල් සමවත් සුවයෙන් වැඩ සිටිනිසා මෙම ස්ථානයද සර්වඥපාරිභෝගික ශුද්ධ භූමියක් බව දතයුතුය. බුදුරදුන්ගේ පටිධාතුවෙන් කොටසක් ද සර්වඥධාතුද මෙහි නිදන් කොට ඇත.

බු.ව. 819 (ක්‍රි.ව. 334) වැන්නෙහි ලක්දිව රජකළ මහසෙන් රජතුමා විසින් මෙම චෛත්‍යරාජයා කරවන ලදී. මෙහි වටප්‍රමාණය අඩි 1,100කි. මුලින් වෛතුල්‍යවාදියකු වූ මෙම රජතුමා මහා විහාරයට අයත්ව තිබූ විහාර දාගැබ් කඩා විනාශ කරවිය. පසුව ඔහුගේ ඇමතියකු කරුණු පැහැදිලිකර දීමෙන් පසු කරුණු තේරුම් ගෙන නැවත ඒවා ප්‍රතිසංස්කරණය කරන ලදී. පසුව වරින් වර මෙය අභාවයට ගිය අවස්ථාවල අග්බෝ, ශිලාමේඝ, දෙටුතිස් යන රජවරු මෙයට ආරක්ෂාව සලසාදී ඇත. පසුකාලයක ඇතිවූ ජේතවන නිකායෙහි මූලස්ථානයද මෙම ජේතවන විහාරය විය.

දැනට ගරාවැටී ඇති මෙම චෛත්‍යයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු වර්තමාන ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා ක්‍රි.ව. 1980 ජනවාරි 1 වැනි දුරුතුපුණු පොහෝද ආරම්භ කළේය. මේ වනවිටත් එහි එම කටයුතු කෙරෙමින් පවතී.

### 7. ලඞ්කාරාමය

මෙම ලඞ්කාරාමය කලකට පෙර " ගල්ගෙබ්කඩ " විහාරය නමින් ව්‍යවහාරවූ බව සඳහන් වෙයි. බු.ව. 455 (ක්‍රි.පූ. 89) දී පමණ රජකළ අභයගිරි චෛත්‍යය කරවූ වළගම්බා රජතුමාම කරවන ලද්දකි. මෙම චෛත්‍යයෙහි නිදන්කොට තිබෙන ධාතූන් ගැන හෝ නිදන් වස්තූන් ගැන පොතපතක සොයා ගැනීමට නොහැක. එහෙත් මෙහි සර්වඥධාතු නිදන්කොට ඇතැයි සිතිය හැකිය. මෙහි වටප්‍රමාණය අඩි 150ක් පමණ වන අතර උස අඩි 50ක් පමණ වේ. මෙම චෛත්‍යරාජයාගේ හැඩය අනුරාධපුර ඇති අනිත් චෛත්‍යවලට වඩා වෙනස් ස්වරූපයක් ගෙන ඇත. එය සිදුවන්නට ඇත්තේ මෑතදී කළ ප්‍රතිසංස්කරණ කටයුතුවලදී විය හැකිය. ද්‍රවිඩයන් සමඟ යුද්ධකොට පැරදී පලාගිය වළගම්බාරජු ස්වල්පකාලයක් " ගල්ගෙබ්කඩ " සැඟවී සිටි කාලයේ තමාට ආරක්ෂාවීමට පිහිටවූ නිසා නැවත රාජ්‍යයට පැමිණි පසු එම ස්ථානයේ විහාරයක් හා චෛත්‍යයක් කරවිය. එම චෛත්‍යයේ ආරක්ෂාවට වටද ගෙයක්ද කරවා ඇත. එම චෛත්‍යයයි අද ලඞ්කාරාමය යනුවෙන් හඳුන් වන්නේ. රජතුමා එදා තමාට පිහිටවූ ඒ ස්ථානය පසුව අද්විතීය වන්දනීය ස්ථානයක් බවට පත්කළ හැටි මෙයින් පෙනේ.

### 8. මිරිසවැටිය

පළමුවෙන් සංඝයාට දන් නොදී කිසිවක් අනුභව කිරීම දුටුගැමුණු රජුගේ සිරිත නොවිය. මහාසංඝයාට නොපිළිගන්වා මිරිස් වැටියක් වැළඳූ එක් අවස්ථාවක් ගැන සිහිවූ රජතුමා එයට දඬුවමක් වශයෙන් මේ චෛත්‍යය කරවන ලද බැවින් එයට මරිචවට්ටි විහාරය — " මිරිසවැටිය " යන්න ව්‍යවහාර විය.

බු.ව. 383 (ක්‍රි.පූ. 161) වැන්නෙහි දුටුගැමුණු රජතුමන් විසින් මෙ චෛත්‍යය කරවන ලදුයේ ශාන්ති නායක බුදුරදුන්ගේ ශ්‍රීපාදස්පර්ශයෙන් පවිත්‍රවූ ස්ථානයෙකැයි විශ්වාස කෙරේ. මෙම චෛත්‍ය රාජයා දුටුගැමුණු රජු විසින් කරවූවාට පසු වෝහාරතිස්ස, I වන කාශ්‍යප, II වන කාශ්‍යප යන රජුන් විසිනුදු ප්‍රතිසංස්කරණය කරවන ලදී. බු.ව. 2435 (ක්‍රි.ව. 1892) වැන්නෙහි ලක්දිවට පැමිණි සියම් රාජකුමාරයකුගේ ධන පරිත්‍යාගයෙන් චෛත්‍යයේ 3/2ක් පමණ ලක්රජය මහින් ප්‍රතිසංස්කරණය කොට ඇත. දනට වැඩ නිමාවී ඇති කොටස වටින් අඩි 560ක් පමණ ද උඩින් අඩි 75ක් පමණ ද වේ. මෙකල ශ්‍රී ලංකා රජය විසින් නොපමාව මෙහි අඩාළ කටයුතු කරවා සම්පූර්ණ චෛත්‍යය යථා ස්ථානයට පත්කිරීමෙ අදහසින් කටයුතු කරගෙන යන බැව් දක්නට ලැබේ.


ආශ්‍රිත ග්‍රන්ථ: —

(i) මහා වංශය.
(ii) ථූප වංශය.
(iii) සද්ධර්ම රත්නාකරය (කලපලුවාවේ ධර්මකීර්ති ශ්‍රී සුගුණසාර දේවානන්ද).
(iv) පූජාවලිය (33 පරිච්ඡේදය ත්‍රෛතියාගමන කථා).
(v) සම්බුද්ධ ශාසන ඉතිහාසය — තලල්ලේ ධම්මානන්ද නාහිමි.